# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

**(117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 අගෝස්තු මස 29 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජූලි මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[139 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 24.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

### නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ කේවියට් තහනමක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කිරීමට අදාළ විධිවිධානවල විෂය පථය පුළුල් කිරීම සහ ඇතැම් පද අර්ථනිරූපණය කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ කේවියට් තහනමක් ඉල්ලා අස්කර ගැනීම සහ අවලංගු කිරීමට අදාළව වගන්තියේ විෂය පථය පුළුල් කිරීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ නිරානුකූලත්වය සඳහා විධිවිධාන සැලසීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එය ඉහත වගන්ති මගින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

එල්.ඩී.—ඕ. 2/2021

**(117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2022 අංක      දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 32 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 117 වන අධිකාරයේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) (අ) (මෙහි මින් මතු "ඉඩම" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉඩමකට, නොබෙදූ ඉඩමකට, ඉඩම් කොටසකට හෝ සහාධිපත්‍ය කොටසකට -

(i) අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ඇත්තා වූ; හෝ

(ii) අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ඇති බවට හිමිකම්පාන්නා වූ,

(මෙහි මින් මතු "කේවියට්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු විසින්, එකී ඉඩමට අදාළ යම් සාධන පත්‍රයක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කිරීමක් පිළිබඳ ව තමා වෙත දැන්වීමක් කළ යුතු බවට නියම කරමින්, මෙහි දෙවන උපලේඛනයේ VIII වන ආකෘතියෙහි වූ කේවියට් තහනමක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම කේවියට් තහනමක් ම -

(i) පිටපත් දෙකකින් යුක්ත විය යුතු අතර, ඒ සමඟ, එකී ඉඩමට කේවියට්කරුට ඇති අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාව හෝ කේවියට්කරු විසින් ඉඩම සම්බන්ධයෙන් හිමිකම්පාන්නා වූ අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාව සනාථ කරන කේවියට්කරුගේ දිවුරුම් පෙත්සමක් සහ නීතිඥවරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ii) කේවියට්කරු හිමිකරු නොවන අවස්ථාවක, එකී ඉඩම ලියාපදිංචි කර ඇති අදාළ වෙළුමේ සහ පත් ඉරුවේ නම් සහ ලිපින සඳහන් හිමිකරුවන් වෙත භාර දෙනු ලැබීම සඳහා, මුද්දර යෙදූ ලිපිකවර සමග දෙවන උපලේඛනයේ X වන ආකෘතියෙහි වන දැන්වීමක පිටපත් අවශ්‍ය සංඛ්‍යාවක් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(iii) කේවියට්කරු, (මින් මතු "ඇටෝර්නි බලකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ඇටෝර්නි බලපත්‍රයක් දරන්නකු වන අවස්ථාවක දී, එකී කේවියට්කරු විසින්, (මින් මතු "රෙජිස්ට්‍රාර්" යනුවෙන් සඳහන් කරනු ලබන) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ අදාළ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත යථා පරිදි ලියාපදිංචි කළ ඇටෝර්නි බලපත්‍රයේ මුල් පිටපතේ සහතික කළ පිටපතක් ද සමඟ ඉදිරිපත් කළ යුතු ය; සහ

(iv) කේවියට්කරුගේ නම, අත්සන සහ ජාතික හැඳුනුම්පතේ අංකය හෝ විදේශ ගමන් බලපත්‍රයේ අංකය, හෝ රියදුරු බලපත්‍රයේ අංකය කේවියට් තහනමට අදාළ දැන්වීම් භාරදිය යුතු කේවියට්කරුගේ ශ්‍රී ලංකාවේ ලිපිනය, කේවියට් තහනමේ දිනය, කේවියට්කරු හිමිකරු නොවන අවස්ථාවක දී කේවියට් තහනම පිළිබඳ දැන්වීම යැවිය යුතු තැනැත්තන්ගේ නම් සහ ලිපින, ඉඩමට කේවියට්කරු විසින් හිමිකම් පාන අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාව, හිමිකම් පෑම තහවුරු කරන්නා වූ කරුණු, මායිම් හා ඉඩම ලියාපදිංචි කළ නිවැරදි වෙළුම හා පත්‍රිරුව දක්වන ඉඩම පිළිබඳ විස්තරයක් ද, ඇතුළත් විය යුතු ය.

(ඇ) මෙම වගන්තියේ කාර්යය සඳහා-

(i) "කේවියට්කරු" යන්නට සංස්ථාවක්, ඉඩමකට අදාළ යම් භාරයක අර්ථලාභියා, බාලවයස්කරුවකුගේ සිහිවිකල තැනැත්තකුගේ හෝ මානසික වශයෙන් දුබල තැනැත්තකුගේ නීත්‍යානුකූල භාරකරු හෝ සහාය මිත්‍රයා, විනිශ්චිත ණයකරු, මරණකරුවකුගේ බූදලයක පොල්මඃකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ නීත්‍යානුකූල උරුමකරුවකු හෝ ඉඩමක හිමිකරු සමග ගිවිසුම්ගතව ඇති අපේක්ෂිත ගැණුම්කරුවකු හෝ ඉඩමක් සංවර්ධනය කරන්නකු අයත් වේ;

(ii) "සහාධිපත්‍ය කොටස" යන්නෙන් 1973 අංක 11 දරන ජාතික රාජ්‍ය සභාවේ

බද්ධ නිවාස අයිතිකම් පනතේ 10 වන වගන්තිය අනුව 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය කොටසක් අදහස් වේ; සහ

(iii) "සම්බන්ධතාවක්" යන්නට, ක්ෂණිකව ලියාපදිංචි කළ නොහැකි වන්නා වූ ඉඩමකට අදාළ ලියාපදිංචි නොකළ ඔප්පුවකින් හෝ සාධන පත්‍රයකින් පැනනගින්නා වූ, භාරයකින් පැනනගින්නා වූ, අන්තිම කැමති පත්‍රයක් හෝ අන්තිම කැමති පත්‍රයක් නොමැතිව අනුප්‍රාප්තියක් මගින් ලද උරුමයකින් පැනනගින්නා වූ, උකස් කිරීම් හෝ විකුණුම් ගිවිසුමකට අදාළ සාධන පත්‍රවලින් පැනනගින්නා වූ, සම හිමිකාරත්වයකින් පැනනගින්නා වූ හෝ බාලවයස්කාරයකුගේ බූදලයකින් පැනනගින්නා වූ,

සම්බන්ධතාවක් ද ඇතුළත් වේ.";

(2) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(1අ) රෙජිස්ට්‍රාර්වරයා විසින්, කේවියට්කරු (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් අවශ්‍ය සියලු ලේඛන හා තොරතුරු සපයා ඇති බවට සෑහීමට පත්වීමෙන් අනතුරුව, එකී කේවියට් තහනම ලද බවට දැන්විය යුතු අතර, 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් නියමිත තොරතුරු වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(1ආ) රෙජිස්ට්‍රාර්වරයා විසින්, කේවියට් තහනම ලැබීමෙන් පසු, (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ (iv) වන අනුඡේදය යටතේ කේවියට්කරු විසින් නම් හා ලිපින ලබා දුන් තැනැත්තන් වෙත වහාම දන්වනු ලැබිය යුතු අතර,

(1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් දැන්වීම යවන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපින වෙනත් කරුණු තීරයේ සටහන් කළ යුතු ය.";

(3) එහි (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) කේවියට් තහනමක් උපරිම අවුරුදු දෙකක කාලයක් සඳහා වලංගු විය යුතු ය.";

(4) එහි (4) වන උපවගන්තියේ "කේවියට්කරු වෙත යවනු ලබන දැන්වීම, නියමිත ආකෘතියේ විය යුතු ය" යන වචන වෙනුවට "කේවියට් තහනමේ විස්තර කර ඇති එකී ඉඩම සම්බන්ධයෙන් සාධන පත්‍රයන් ලියාපදිංචිය සඳහා ඉන් පසුව ඉදිරිපත් කර ඇති අවස්ථාවක, කේවියට්කරුට දෙවන උපලේඛනයේ XI හි සඳහන් ආකෘතියෙහි වූ දැන්වීමක් යැවිය යුතු ය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(5) එහි (5) වන උපවගන්තියේ "බලයලත් අධිකරණයක් මගින් දින තිහක් ඇතුළත" යන වචන වෙනුවට "බලයලත් අධිකරණයක් විසින් දින හැටක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ "තහනම් පූර්වතා දැන්වීමක්, කේවියට් තහනමක් හෝ ලිස්පෙන්ඩනයක්" යන වචන වෙනුවට "තහනම් පූර්වතා දැන්වීමක් හෝ ලිස්පෙන්ඩනයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) (අ) කේවියට් තහනමක් -

(i) කේවියට්කරු විසින්;

(ii) ඇටෝර්නි බලකරු විසින්;

(iii) කේවියට්කරු මිය යාමේදී, පොල්මඃකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ නෛතික උරුමකරුවකු විසින්;

(iv) කේවියට් තහනම ඉදිරිපත් කර ඇත්තේ බාල වයස්කරුවකු, සිහිවිකල තැනැත්තකු හෝ මානසික වශයෙන් දුබල තැනැත්තකු වෙනුවෙන් ඔහුගේ නීත්‍යනුකූල භාරකරු හෝ සහාය මිත්‍රයා නම්, එකී භාරකරු හෝ සහාය මිත්‍රයා විසින්, නීත්‍යනුකූල භාරකරු මිය යාමෙන් හෝ ඔහුව ඉවත් කිරීමෙන් ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, හෝ වයෝපූර්ණත්වයට පත්වීමෙන්, බාලවයස්කරු විසින්;

(v) හවුල් කේවියට්කරුවන් සිටින්නේ නම්, ඔවුන්ගෙන් එක් කේවියට්කරුවකු හෝ කේවියට්කරුවන් කිහිපදෙනෙකු මිය යාමේ දී ජීවත්ව සිටින කේවියට්කරුවන් විසින්;

(vi) බුන්වත් බවට විනිශ්චය කරනු ලැබුවේ නම් නිල වශයෙන් පත් කරනු ලැබූ තැනැත්තා විසින්;

(vii) කේවියට්කරු සංස්ථාවක් වන්නේ නම් සහ එය ඈවර වෙමින් පවතින්නේ නම් සහ කේවියට්කරු හිමිකම්පාන සම්බන්ධතාව අධිකරණය විසින් පත් කරනු ලබන ඈවරකරුවකු වෙත හෝ නිල භාර ගැණුම්කරු වෙත පවතින විට, එම ඈවරකරු විසින්;

(viii) කේවියට් තහනමට විෂයය වූ බූදලය සම්බන්ධයෙන් බලයලත් අධිකරණයක් විසින් තීන්දුවක් නිකුත් කර ඇති අවස්ථාවක දී අධිකරණයේ ෆිස්කල්වරයා හෝ එකී තීන්දුව යටතේ අයිතියක් ලබන වෙනත් යම් තැනැත්තකු විසින්,

ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත ඉල්ලා අස්කර ගැනීමට හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(ආ) මෙහි (අ) ඡේදය යටතේ ඉල්ලා අස්කර ගැනීමේ සාධන පත්‍රයක් ලැබීමෙන් රෙජිස්ට්‍රාර්වරයා -

(i) ඉහත කී ආකාරයට කේවියට් තහනම පිළිබඳ රෙජිස්ටරයේ වූ සටහන අවලංගු කර එහි දිනය යෙදිය යුතු ය; සහ

(ii) එකී කේවියට් තහනමින් සිය අයිතියට, හිමිකමට හෝ සම්බන්ධතාවට බලපෑම් එල්ල වූ තැනැත්තන් හෝ සංස්ථා වෙත දැන්විය යුතු ය.".

(3) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(2අ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කේවියට් තහනමක් පිළිබඳ (2) වන උපවගන්තිය යටතේ වූ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වූ යම් සිතාසියක්, දැන්වීමක්, නෛසයි ආඥාවක් හෝ තීන්දුවක් 32 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) වන අනුඡේදයේ සඳහන් පරිදි කේවියට්කරුගේ ශ්‍රී ලංකා ලිපිනය වෙත යැවිය යුතු ය.".

(4) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(4) (3) වන උපවගන්තිය යටතේ කේවියට් තහනමක ලියාපදිංචිය අවලංගු කළේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද, එකී ඉඩම සම්බන්ධයෙන් ම එම කේවියට්කරු ම ඉදිරිපත් කරන කේවියට් තහනමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ "අවස්ථානුකූලව අවශ්‍ය වන වෙනස්වීම් සහිතව යොදා ගත යුතු ය; නමුත් එම උපලේඛනය නියෝග මගින් වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට "අවස්ථානුකූලව අවශ්‍ය වන වෙනස්වීම් සහිතව යොදා ගත යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය, පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි VIII වන ආකෘතිය වෙනුවට පහත සඳහන් අලුත් ආකෘතිය ආදේශ කිරීමෙන්:-

"VIII වන ආකෘතිය

[32(ආ) වගන්තිය)]

මෙහි උපලේඛනයේ සඳහන් කරනු ලබන (මට අයත්/වෙනත් අයෙකුට අයත් - අයිතිය/ හිමිකම/ සම්බන්ධතාව සඳහන් කරන්න) ........................................ ඉඩමට අදාළ යම් සාධන පත්‍රයක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන විට, (ජාතික හැඳුනුම්පත්/විදේශ ගමන් බලපත්‍ර/රියදුරු බලපත්‍ර) අංක: .................................................................... දරන .................................................................................... (කේවියට්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය ඇතුළත් කරන්න) වන මා වෙත, දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

තව ද, මෙම කේවියට් තහනම මා වෙනුවෙන් (කේවියට්කරු හිමිකරු නොවන විට) ................................ වෙනුවෙන් මවිසින් ඉදිරිපත් කරනු ලබන්නේ පහත කාරණාව/කාරණා මතය.

ඔප්පු අංක ...................... යටතේ

අන්තිම කැමති පත්‍ර ...................... යටතේ

වෙනත් (නිශ්චිතව දක්වන්න) ........................................

යටතේ හිමිකම.

තව ද, මේ සම්බන්ධයෙන් වූ දැන්වීම යොමු කිරීමේ ස්ථානය ලෙස මවිසින් (ශ්‍රී ලංකාවේ ලිපිනය) නම් කරමි.

................................

කේවියට්කරුගේ/ඔහුගේ නීතිඥවරයාගේ හෝ නොතාරිස්වරයාගේ/ඇටර්නි බලකරුගේ අත්සන

දිනය : .........................................

ඉහත නම් සඳහන් ............................................ (සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම් හා ලිපින) ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

1. පළමුවන සාක්ෂිකරුගේ අත්සන

2. දෙවන සාක්ෂිකරුගේ අත්සන

උපලේඛනය

(13 වන වගන්තියේ පරිදි සහ පෙර ලියාපදිංචි කිරීම් දන්නේ නම්, විස්තර කරන්න)"; සහ

(2) එහි IX වන ආකෘතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන්:-

"X වන ආකෘතිය

[32(1)(ආ)(ii) වගන්තිය)]

කේවියට් තහනමක් ලියාපදිංචි කළ දේපළක අයිතිකරු වෙත කරනු ලබන දැන්වීම

.............................................. නමැති හා වරිපනම් අංක: ......................... දරන ඉඩම සම්බන්ධයෙන් ............................................. යන අය කේවියට් තහනමක් ඉදිරිපත් කරනු ලැබූ බවත් එය මෙම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ....................... වෙළුමේ පත්ඉරු අංක: ....................... හි ලියාපදිංචි කරන ලද බවත් මෙයින් දන්වමි.

................................

(අත්සන)

(ඉඩම් රෙජිස්ට්‍රාර් .......................)

දිනය : ............................

XI වන ආකෘතිය

[32(4) වගන්තිය]

ලියාපදිංචිය අපේක්ෂාවෙන් පවතින සාධන පත්‍රයක් පිළිබඳ කේවියට්කරුට නිකුත් කරන දැන්වීම

ඔබ විසින් ඉදිරිපත් කරන ලද ........... දිනැති ....................... අංක දරන කේවියට් තහනමට එදිරිව, මේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ....................... වෙළුමේ.......................පත්ඉරුවේ ලියාපදිංචිය අපේක්ෂාවෙන් මෙහි උපලේඛනයේ සඳහන් සාධන පත්‍රය පවතින බව ඔබ වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

......................

(අත්සන)

........... හි ඉඩම් රෙජිස්ට්‍රාර්

දිනය : ....................

| ඔප්පු අංකය | ඔප්පුවේ/ සාධන පත්‍රයේ ස්වභාවය | ඔප්පුව/ සාධන පත්‍රය සහතික කළ නොතාරිස්වරයාගේ නම | ඉඩම පිළිබඳ විස්තරය (උපලේඛනයට අනුව) | පාර්ශ්වකරුවන් |
|---|---|---|---|---|
| | | | | |

.”.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව